# 06. වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම - ගැලීම් සටහන

| | |
|---|---|
| ඩිජිටල්කරණ දත්ත භාවිත කිරීම | ඉලෙක්ට්‍රොනික පණිවුඩ / ගනුදෙනු (malimbada.ps@gmail.com) |

සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍රය ලබා ගෙන සම්පූර්ණ කර මිනින්දෝරු සැලැස්ම සමග පෙරටු කාර්යාලයට භාර දීම (වීථි රේඛා නියම කර තිබේ නම් ඉල්ලුම් පත්‍රය හා මිනින්දෝරු සැලැස්මේ මුල් පිටපත අතින් ගෙනැවිත් භාර දිය යුතු ය)

වගකීම: ඉල්ලුම්කරු

සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය සහ මිනින්දෝරු සැලැස්ම භාර ගෙන මිනින්දෝරු සැලැස්මේ ආධාරයෙන් සහ ඉල්ලුම්කරු විමසීමෙන් ඉඩමට මායිම් වී ඇති මාර්ග හඳුනා ගැනීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

මාර්ගය හඳුනා ගත්තේ ද?

- නැත → තාක්ෂණ නිලධාරි විමසන්න (වගකීම: පෙරටු කාර්යාල නිලධාරි) → මාර්ගය හඳුන්වා දීම (වගකීම: තාක්ෂණ නිලධාරි) → වීථි රේඛා නියම කර තිබේ ද?
- ඔව් → වීථි රේඛා නියම කර තිබේ ද?

වීථි රේඛා නියම කර තිබේ ද?

- ඔව් → ඉල්ලුම්කරුට පසු විපරම් අංකයක් නිකුත් කර විෂය භාර නිලධාරි මගින් ඉංජිනේරු / තාක්ෂණ නිලධාරි වෙත ඉල්ලුම් පත්‍රය සහ මිනින්දෝරු සැලැස්මේ මුල් පිටපත යොමු කිරීම (වගකීම: පෙරටු කාර්යාල නිලධාරි) → මිනින්දෝරු සැලැස්මේ වීථි රේඛාව සලකුණු කර පෙරටු කාර්යාලයට යොමු කිරීම (වගකීම: ඉංජිනේරු / තාක්ෂණ නිලධාරි) → වීථි රේඛා සහතිකය සහ ගොඩනැගිලි සීමා සහතිකය නිකුත් කිරීම
- නැත → වීථි රේඛා සහතිකය සහ ගොඩනැගිලි සීමා සහතිකය නිකුත් කිරීම

වීථි රේඛා සහතිකය සහ ගොඩනැගිලි සීමා සහතිකය නිකුත් කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි



# 06. වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම

1. හැඳින්වීම.

(අ) වීථි රේඛා සීමාව

i. පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටි යම් පාරවල් ගමනාගමනයට පහසු ආකාරයෙන් පළල් කිරීමට ඒ පළාත් පාලන ආයතනය තීරණය කර ඇති අවස්ථාවක, ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ කොටස් නිරූපණය කරන මිනින්දෝරු පිඹුරක දැක්වෙන ඒ පාරවල්, ඉදිරියේ දී පළල් කිරීමට අපේක්ෂා කරන ඉඩ ප්‍රමාණය ඒ සිතියමෙහි සලකුණු කිරීම මගින් ඒ පාරවල් දෙපස පිහිටි ඉඩම්වලින් අදාළ පාරට ඈඳා ගන්නා භූමි ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා පළාත් පාලන ආයතනය විසින් තීරණය කර ඒ පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ සහ පුවත් පත් නිවේදන මගින් ප්‍රසිද්ධ කළ යුතු ව ඇත. මේ තීරණය ගැනීමෙන් පසු අදාළ මිනින්දෝරු පිඹුරෙහි සටහන් කර ඇති මායිම් රේඛාව වීථි රේඛාව නම් වේ. මේ වීථි රේඛාව තීරණය කළ යම් පාරක මධ්‍යයේ සිට වීථි රේඛා සීමාව දක්වා වන ඉඩම් කොටස යම් ඉදිරි දිනයක පළාත් පාලන ආයතනය විසින් පවරා ගැනීමට යටත් වනු ඇත. මේ හේතුව නිසා ම මේ භූමි ප්‍රමාණය තුළ කිසිදු ඉදි කිරීමක් සඳහා ඉඩ ලබා දීම නො කරනු ඇත.

ii. දැනට ශ්‍රී ලංකාවේ වීථි රේඛා නියම කර ඇත්තේ කොළඹ සහ දෙහිවල - ගල්කිස්ස යන මහා නගර සභා විසින් පමණි. සෙසු පළාත් පාලන ආයතන මෙතෙක් වීථි රේඛා නියම කර නැත.

(ආ) ගොඩනැගිලි සීමාව

i පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ගයක මධ්‍ය රේඛාවේ සිට දෙපසට යම් නිශ්චිත දුර ප්‍රමාණයක් ඇතුළත කිසිදු ඉදිකිරීමක් සඳහා ඉඩ දීම නො කරනු ඇත. මේ සීමාව ගොඩනැගිලි සීමාව ලෙස හඳුන්වනු ලැබේ. නගර සභාවක සහ ප්‍රාදේශීය සභාවක බල ප්‍රදේශයක් ඇතුළත ගොඩනැගිලි සීමාව මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දෙපස ට අඩි විසි පහකි (මීටර් 7.62).

ii. වෙනත් යම් අධිකාරයකට අයත් මාර්ගයක් සම්බන්ධයෙන්, ඒ අධිකාරය විසින් ගොඩනැගිලි සීමාව නියම කර නැති අවස්ථාවක දී, පළාත් පාලන ආයතන බල ප්‍රදේශය ඇතුළත දැනටමත් පවත්වා ගෙන යනු ලබන සහ යෝජිත සෑම පාරක් සඳහා ම ඉහත කී සීමාව බල පැවැත්වේ.

iii. එසේ ම නාගරික සංවර්ධන ප්‍රදේශයකට අදාළ ව, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතෙන් ලැබී ඇති බලය යටතේ, අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් ඒ ප්‍රදේශයේ සංවර්ධන සැලැස්ම අදාළ වන කොටස් ඇතුළත පිහිටා ඇති මාර්ගවලට අදාළ ව ගොඩනැගිලි සීමා නියම කරනු ලැබ ඇත.

iv. තවදුරටත් එසේ ම, මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගවලට අදාළ ව ඒ ආයතනය විසින් ද, කිසියම් පළාතක, පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග සම්බන්ධයෙන් ඒ ආයතන විසින් ද, ගොඩනැගිලි සීමා නියම කරනු ලැබ ඇත.

(ඇ) වීථි රේඛා සහ ගොඩනැගිලි සීමා සහතිකය

i. වීථි රේඛාව පිළිබඳ සහතිකය ලිපියක් මගින් විස්තර කරමින් දැක්විය නො හැක. පළාත් පාලන ආයතනය විසින් නියම කළ වීථි රේඛාව සටහන් කර ඇති මිනින්දෝරු සැලැස්මේ පරිමාණය සහ අදාළ ඉඩමේ මිනින්දෝරු සැලැස්මේ පරිමාණය සැලකිල්ලට ගනිමින්, ඉඩමේ මිනින්දෝරු සැලැස්මේ ඊට අදාළ වීථි රේඛාව සටහන් කර දැක්වීමෙන් මෙම සහතිකය නිකුත් කළ යුතු ය.

ii. ගොඩනැගිලි සීමාව පාරේ මධ්‍ය රේඛාවේ සිට කොපමණ දුරකින් පිහිටා තිබේ ද යන්න ලිපියකින් දැන්වීම කළ හැකි ය.

iii. වීථි රේඛා නියම කර නැති පළාත් පාලන ආයතනයක් වන විට, එවැනි වීථි රේඛා නියම කර නැති බව ලිපියකින් දැන්වීමත් ගොඩනැගිලි සීමාව කොතෙක් ද යන්න දැන්වීමත් කළ යුතු ව ඇත.

iv. වීථි රේඛා නියම කරනු ලබන තෙක්, මේ සහතික දෙක ම ලිපියකින් දැන්වීම කළ හැකි අතර, ඒ සඳහා මෙහි ඇමුණුම් අංක 01 යොදා ගැනීම කළ හැකි ය.

**(ඈ) වීථි රේඛා සහ ගොඩනැගිලි සීමා සහතිකයක අවශ්‍යතාව**

යම් ඉඩමක මූල්‍ය වටිනාකම ගණන් බැලීමේ දී, වීථි රේඛාවක් නියම කර තිබීම හේතුවෙන් යම් දිනක දී එකී ඉඩමෙන් අනිවාර්යයෙන් බැහැර කිරීමට සිදු වන කොටස් සඳහා මූල්‍ය වටිනාකම ශුන්‍ය ලෙස සලකා ක්‍රියා කරනු ලබන අතර සහ කිසිදු ඉදිකිරීමකට ඉඩ නැති ගොඩනැගිලි සීමාව තුළට ඇතුළත් වන ඉඩම් කොටස්වල වටිනාකම ගණන් බැලීමේ දී එකී භූමි ප්‍රමාණයේ වාණිජ වටිනාකම, ඉදිකිරීම් කිරීමට ඉඩ ඇති භූමියක ප්‍රමාණයට වඩා අඩුවෙන් ගණනය කරනු ඇත. මේ අනුව කිසියම් තැනැත්තකු විසින් වාණිජ බැංකුවකින් හෝ වෙනත් යම් මූල්‍ය ආයතනයකින් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් ඇපයට තබා ණය මුදලක් ලබා ගැනීමට කරන ඉල්ලීමකට අනුව, අදාළ ආයතනය විසින් ලබා දිය හැකි ණය මුදලේ ප්‍රමාණය ගණන් බැලීමේ දී මේ සීමා උපයෝගී කර ගනු ඇත. ඒ සඳහා වාණිජ බැංකුව හෝ මූල්‍ය ආයතනයට නියම කර ඇති වීථි රේඛාව සහ ගොඩනැගිලි සීමාව අවශ්‍ය වන බැවින් ණය ඉල්ලුම්කරු ලවා මේ සහතිකය ලබා ගැනීමට ඒ ආයතන ක්‍රියා කරනු ලැබේ.

**2. නීතිමය අධිකාරය**

(අ) වීථි රේඛාව:

i. 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 69 වන වගන්තිය.

ii. 268 අධිකාරය වන නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තිය සහ ඒ යටතේ සාදන ලද රීතිවල 8 වන රීතිය.

(ආ) ගොඩනැගිලි සීමාව:

i. 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 74 (1) (අ);

ii. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 වන වගන්තිය.

iii. 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ, යම් නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සංවර්ධන සැලැස්මෙහි නියම කර ඇති සීමාව;

iv. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග සම්බන්ධයෙන් ඒ අධිකාරය විසින් නියම කර ප්‍රකාශයට පත් කර ඇති ගොඩනැගිලි සීමාව;

v. කිසියම් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියකට අයත් මාර්ග සම්බන්ධයෙන් ඒ අධිකාරය විසින් නියම කර ප්‍රකාශයට පත් කර ඇති ගොඩනැගිලි සීමාව.

**3. සුදුසුකම්**

වාණිජ බැංකුවකින් හෝ වෙනත් යම් මූල්‍ය ආයතනයකින් ණය මුදලක් ඉල්ලා සිටින හෝ තම ඉඩමේ සැබෑ වෙළෙඳ පොළ වටිනාකම තක්සේරු කරවා ගැනීමට අවශ්‍ය කරන යම් තැනැත්තකු විසින් මේ සහතික ඉල්ලා සිටිනු ලැබේ.

**4. ගාස්තුව**

(අ) සභාව විසින් කලින් කල තීරණය කර නියම කරනු ලබන ඉල්ලුම් පත්‍ර ගාස්තුව.

(ආ) සහතිකය නිකුත් කිරීමේ ගාස්තුව.

සටහන: 1. මාර්ග ගත ක්‍රමයෙන් ලබා ගන්නා ඉල්ලුම් පත්‍ර සඳහා ගාස්තු අය කිරීම නොකළ යුතු ය.

2. සහතික නිකුත් කිරීම සඳහා සාධාරණ ගාස්තුවක් අය කළ යුතු ය.

5. **සැපයිය යුතු ලේඛන**

(අ) මෙහි ඇමුණුම 02 හි දැක්වෙන ආකෘතියට අනුව පිළියෙළ කළ ඉල්ලුම් පත්‍රයක් සමග එහි නියම කර ඇති ලේඛන.

(ආ) මිනින්දෝරු සැලැස්මේ පිටපතක් (මෙම සහතිකය නිකුත් කිරීමේ කාර්යය සඳහා පමණක් සැලැස්ම අනුමත කර තිබීම සැලකිල්ලට ගැනීම අනිවාර්ය නොවේ)

6. **පටිපාටිය.**

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| පෙරටු කාර්යාලයෙන් හෝ සභාවේ වෙබ් අඩවියෙන් ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම | | ඉල්ලුම්කරු |
| සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය සහ ඉඩමේ මිනින්දෝරු සැලැස්මේ පිටපත භාර ගැනීම | | පෙරටු කාර්යාල නිලධාරි |
| මිනින්දෝරු සැලැස්මේ ආධාරයෙන් සහ ඉල්ලුම්කරු විමසීමෙන් ඉඩමට මායිම් වී ඇති පාරවල් හඳුනා ගැනීම / හඳුනා ගත නොහැකි විට තාක්ෂණ නිලධාරීගේ සහාය ලබා ගැනීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් අවස්ථාවේ දී ම | පෙරටු කාර්යාල නිලධාරි / තාක්ෂණ නිලධාරි |
| අදාළ දේපළ සම්බන්ධයෙන් සභාවට අය විය යුතු යම් මුදල් ප්‍රමාණයක් තිබේ ද යන්න පරීක්ෂා කර බලා (එවැනි මුදලක් වේ නම්) එය ද සමග සහතිකය නිකුත් කිරීමේ ගාස්තු ප්‍රමාණය අය කර ගෙන ලදුපතක් නිකුත් කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් අවස්ථාවේ දී | පෙරටු කාර්යාල නිලධාරි |
| වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතිකය නිකුත් කිරීම | 1. වීථි රේඛා නියම කර ඇති විට, ඉල්ලුම් පත්‍රය භාර ගත් දින සිට දින තුනක් ඇතුළත<br>2. වීථි රේඛා නියම කර නැති විට, ඉල්ලුම් පත්‍රය භාර දුන් දින ම | 1. ඉංජිනේරු අංශයේ ප්‍රධානියා<br>2. පෙරටු කාර්යාල නිලධාරි |

සටහන:
1. ඉල්ලුම්කරු දේපළෙහි අයිතිකරු නොවන විට, අදාළ සහතිකය ඉල්ලුම්කරුට නිකුත් කිරීම සම්බන්ධයෙන් ඇමුණුම 02 හි ඉල්ලුම් පත්‍රයේ 7 ඡේදය සඳහන් එකඟතාව පළ කර තිබීම අනිවාර්ය වේ.
2. සභාව විසින් වීථි රේඛා නියම කර තිබේ නම්, ඉදිරිපත් කර ඇති පිඹුරු පතෙහි වීථි රේඛාව සලකුණු කර භාර දිය යුතු අතර ඇමුණුම 01 හි ලිපියෙහි ගොඩනැගිලි සීමාව ද දක්වා තිබිය යුතු ය.
3. වීථි රේඛා නියම කර නැති විට ඒ බව සහ ගොඩනැගිලි සීමාව කුමක් ද යන්න සටහන් කර ඇමුණුම 01 හි ලිපිය නිකුත් කළ යුතු ය.

ඇමුණුම 01

මගේ අංකය: . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . සභාව,
. . . . . . . . . . . . . . . . .
20 . . . . . . . . . . . . . . . . දින.

. . . . . . . . . . . . . . . . . . මහත්මා / මහත්මිය / මෙනෙවිය,
මහත්මයාණෙනි / මහත්මියනි / මෙනෙවියනි,

**<u>වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතිකය</u>**

20 . . . . . . . . . . . . දින ඔබ විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම හා බැඳේ.

02. . . . . . . . . . . . . . . සභාව විසින් බල ප්‍රදේශය ඇතුළත විහිදෙන මාර්ග සම්බන්ධයෙන් වීථි රේඛා නියම කර නැත. / ඔබගේ ඉල්ලුම් පත්‍රයට අදාළ ඉඩමේ වීථි රේඛාව, ඔබ විසින් ඉදිරිපත් කළ පිඹුරු පතේ සටහන් කර මේ සමග එවමි.

03. ඔබගේ ඉල්ලීම සමග ඉදිරිපත් කර ඇති බලයලත් මිනින්දෝරු . . . . . . . . . . . . . . . . . . . . . . . මහත්මා විසින් අඳින ලද, අංක . . . . . . . . . . . . හා 20 . . . . . . . . . . . . . . දින පිඹුරු පතට අදාළ ඉඩම:-

@ . . . . . . . . . . . . . . . සභාවට අයත්;

@ මාර්ග සංවර්ධන අධිකාරියට අයත්;

@ පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරියට අයත්;

@ . . . . . . . . . . . . . . . . . . ට සහ . . . . . . . . . . . . . . . . . ට සහ . . . . . . . . . . . . . . . . . . . . ට අයත්;

මාර්ගයකට / මාර්ගවලට මුහුණු ලා පිහිටා ඇත.

04. ඒ ඉඩමේ:-

\# උතුරු දිශාවට මායිම් වූ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට ගොඩනැගිලි සීමාව අඩි . . . . . . . . (. . .’)
[මීටර් . . . . . . . . . . . (. . . . . .) කි.

\# නැගෙනහිර දිශාවට මායිම් වූ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට ගොඩනැගිලි සීමාව අඩි . . . . . . (. . .’)
[මීටර් . . . . . . . . . (. . . . . .) කි.

\# දකුණු දිශාවට මායිම් වූ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට ගොඩනැගිලි සීමාව අඩි . . . . . . . . (. . .’)
[මීටර් . . . . . . . . . . . (. . . . . .) කි.

\# බටහිර දිශාවට මායිම් වූ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට ගොඩනැගිලි සීමාව අඩි . . . . . . . . (. . .’)
[මීටර් . . . . . . . . . . . (. . . . . .) කි.

මෙයට විශ්වාසී,

. . . . . . . . . . (නම) . . . . . . . . . .

නාගරික කොමසාරිස් / ලේකම් වෙනුවට,

. . . . . . . . . . . . . . . . . සභාව

QR Code

(නිල මුද්‍රාව තබන්න)

ඇමුණුම අංක 02

## . . . . . . . . . . . . . . . සභාව

# වීථිරේඛා / ගොඩනැගිලි සීමා සහතිකයක් ඉල්ලුම් කිරීම

(අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර අවසාන පිටුවේ ඇති උපදෙස් හොඳින් කියවන්න)

1. පෞද්ගලික තොරතුරු.
   - (අ) ඉල්ලුම්කරුගේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ආ) හැඳුනුම්පත් අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඇ) ජංගම දුරකථන අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඈ) ඊ - මේල් ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඉ) තැපැල් ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
2. දේපළෙහි තොරතුරු:
   - (අ) දේපළෙහි ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ආ) වරිපනම් අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඇ) මිනින්දෝරු සැලසුම් අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඈ) ලොට්/කැබලි අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඉ) ඔප්පුවේ අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඊ) සහතික කල නොතාරිස්ගේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
3. ඉඩමට මායිම් වී ඇති මාර්ග විස්තරය:
   - (අ) ඉඩමට මායිම් ව ඇති මාර්ග ගණන : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ආ) උතුරට පිහිටි මාර්ගයේ (ඇත්නම්) නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඇ) නැගෙනහිරට පිහිටි මාර්ගයේ (ඇත්නම්) නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඈ) දකුණට පිහිටි මාර්ගයේ (ඇත්නම්) නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   - (ඉ) බටහිරට පිහිටි මාර්ගයේ (ඇත්නම්) නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
4. මෙම ඉල්ලුම් පත්‍රය අවසානයේ සඳහන් උපදෙස්වල දක්වා ඇති ලේඛන ඉල්ලුම් පත්‍රයට අමුණන්න.
5. සහතිකය අවශ්‍ය කාරණය හා එය ඉදිරිපත් කළ යුතු ආයතනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
6. ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. / කරමු. ඉහත සඳහන් ඉඩමට අදාළ වීථිරේඛා / ගොඩනැගිලි සීමා සහතිකය ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ඉල්ලුම්කරුගේ අත්සන.

7. ඉල්ලුම්කරු දේපළ හිමිකරු නොවන විට දේපළ හිමිකරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් දේපළෙහි හිමිකරු මම වෙමි. . . . . . . . . . . . . . . . . . . දින සිට මේ දක්වා ඒ දේපළ මා හට අයිතිව ඇති අතර ඉහත සඳහන් ඔප්පු අංක හා පිඹුරු අංක නිවැරදි බවට සහතික කරමි. ඉහත අයදුම්කරු ඉල්ලා සිටින තොරතුරු ඔහු වෙත නිකුත් කිරීම පිළිබඳව මගේ එකඟතාව මෙයින් පළ කරමි.

නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ජාතික හැඳුනුම්පත් අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ලිපිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දේපළ හිමිකරුගේ අත්සන.

**<u>වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික ඉල්ලුම් කිරීමට උපදෙස්.</u>**

පහත සඳහන් උපදෙස් අනුව අයදුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කරන්න.

1. අයදුම් පත්‍රය සමඟ පහත සඳහන් ඇමුණුම් ඉදිරිපත් කළ යුතු ය. (ඡායා පිටපත් ඉදිරිපත් කිරීමේ දී පරීක්ෂා කිරීම සඳහා මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය)
   - (අ) ඉඩමට අදාළ මිනින්දෝරු සැලැස්මේ (පිඹුරු පත) පිටපතක්.
   - (ආ) කිසියම් බැංකුවකින් ණයක් ලබාගෙන තිබීමේ හේතුව මත දේපළට අදාළ ඔප්පුවේ සහ පිඹුරුපතෙහි (මිනින්දෝරු සැලැස්මෙහි) මුල් පිටපත ඒ බැංකුවෙහි රඳවා තබාගෙන ඇති අවස්ථාවක, අදාළ බැංකුවේ කළමණාකරු විසින් සහතික කරන ලද ඒවායෙහි පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
   - (ඇ) ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පතේ ඡායා පිටපත.
2. ඉඩමේ අයිතිය වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතිකය ලබා ගන්නා තැනැත්තාට හිමි නොවේ නම් ඉහත ඉල්ලුම් පත්‍රයේ අනු අංක 7 කොටස සම්පූර්ණ කර තිබිය යුතු ය.
3. වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතිකය නිකුත් කිරීමට අදාළ ඉල්ලුම් පත්‍රය භාර දෙනු ලබන අවස්ථාවේදී, පහත (අ) සිට (ඉ) දක්වා වන ගාස්තු ගෙවා තිබිය යුතු ය. (ආ) සිට (ඉ) දක්වා වන හිඟ මුදල් ප්‍රමාණය පෙරටු කාර්යාල නිලධරයා විමසා දැනගත හැකි ය.
   - (අ) වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීමේ ගාස්තුව රු. . . . . . . . . . කි.
   - (ආ) රජය මගින් නියම කර ඇති බදු
   - (ඇ) හිඟ වරිපනම් / අක්කර බදු (වරෙන්තු ගාස්තු සමග)
   - (ඈ) හිඟ ජල සැපයුම් ගාස්තු (ප්‍රමාද ගාස්තු ඇත්නම්, ඒ සමග)
   - (ඉ) අපද්‍රව්‍ය බැහැර කිරීමේ හිඟ ගාස්තු (හිඟ)
   - (ඊ) හිඟ කර්මාන්ත බදු / ව්‍යාපාර බදු
4. ඉහත උපදෙස් අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය පෙරටු කාර්යාල නිලධරයාට භාර දී ලදුපතක් ලබා ගන්න.